**කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය**

**05 වන බී. ඒ. එම්. එස්. වාර්ෂික පරීක්ෂණය - 2016 ජනවාරි**

## නිදාන චිකිත්සා I

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාලය - පැය 03
පෙ. ව. 9.00 – මධ්‍යාහ්න 12. 00

01 i අශ්මරි ප්‍රභේද නම් කර එක් එක් ප්‍රභේදය පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 07)**

ii අශ්මරි රෝගියකුට ප්‍රතිකාර කිරීමේදී අනුගමනය කළ යුතු චිකිත්සා මූලධර්ම පහදන්න. **(ලකුණු 06)**

iii අශ්මරි රෝගියකුට යෙදිය හැකි කෂාය දෙකක් නිෂ්පාදිත ඖෂධ පහක් දක්වන්න. **(ලකුණු 07)**

02 i කිලාස යන්න කුෂ්ඨ රෝග අධිකාරියෙහි දැක්වීමට හේතු දක්වන්න. **(ලකුණු 05)**

ii කිලාස රෝගයේ ලක්ෂණ සහ සාධ්‍ය හා අසාධ්‍ය ලක්ෂණ වෙන වෙනම ලියා දක්වන්න. **(ලකුණු 06)**

iii ශ්වීත්‍ර රෝගයට ප්‍රතිකාර පද්ධතියක් ලියන්න. **(ලකුණු 06)**

iv විසර්ප රෝගය කෂායක ගුණ පාඨයෙහි එන කෂායක් සම්පූර්ණ කර දක්වන්න. **(ලකුණු 03)**

03 i අවිපාක ක්ලමෝත්ක්ලේෂ ............................

ඉහත ශ්ලෝකය සම්පූර්ණ කර මෙම රෝග ලක්ෂණ කුමන රෝගයකදී පහළවන්නේ දැයි සඳහන් කරන්න. **(ලකුණු 05)**

ii එම රෝගය සඳහා අනුගමනය කරනු ලබන චිකිත්සා මූලධර්ම කෙටියෙන් දක්වා යෝග්‍ය කෂාය 02 ක් වට්ටෝරු කර දක්වන්න. **(ලකුණු 12)**

iii ඉහත රෝග අවස්ථාවේ සාධ්‍යාසාධ්‍යතාව දක්වන්න. **(ලකුණු 03)**

04 කෙටි සටහන් ලියන්න.

i දාහ ප්‍රභේද දක්වා පිත්තජ දාහ ලක්ෂණ සාකච්ඡා කරන්න.

ii ජලෝදර රෝගය සඳහා භාවිතා වන චිකිත්සා මූලධර්මය විස්තර කරන්න.

iii ජාලගර්දභ සහ පාෂාණ ගර්දභ රෝග අවස්ථා වෙන වෙනම විස්තර කරන්න.

iv උන්මාද හා අපස්මාර රෝග අතර ඇති සම්බන්ධතා කෙටියෙන් පහදන්න.

**(ලකුණු 5 X 4 = 20)**

05 පහත සඳහන් කෂාය වට්ටෝරු කරන්න.

i අමෘතාෂ්ටකය

ii භූනිම්භ දාරු දශමූල

iii අමෘතවෘෂ පටෝලං

iv රසොනමුණඩී කවරි ධනංජයෝ

**(ලකුණු 5 X 4 = 20)**

2016. 02. 08